www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: බැල්මොරල් වතුයායේ ක්‍රියාකාරී කමිටුව සියලු කම්කරුවන්ගෙන් කරන ඉල්ලීමකි

## Sri Lanka: An appeal to all workers by the Balmoral Estate Action Committee

**2009 සැප්තැම්බර් 22**

*පහත පලවන්නේ, වර්තමාන වැටුප් ගිවිසුම ප්‍රතික්ෂේප කිරීමේ හා සියලු වෘත්තීය සමිතිවලින් ස්වාධීන වූ ක්‍රියාකාරී කමිටුවක් ගොඩනගමින් අරගලය සියතට ගැනීමේ තම ආරම්භකත්වය අනුගමනය කරන ලෙස ඉල්ලා සිටිමින් ආගරපතන බැල්මොරල් තේ වතුයායේ කම්කරුවන් විසින් රට පුරා විසිර සිටින තේ, රබර් හා පොල් වැවිලි කර්මාන්තයේ නියුතු සියලු කම්කරුවන් වෙත නිකුත කරන ලද ඉල්ලීමකි.*

*සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) දේශපාලන සහයෝගය ඇතිව පසුගිය සතියේදී බැල්මොරල් වතු යායේ ක්‍රියාකාරී කමිටුව ගොඩනගන ලදී. 20 වන දින පැවති කමිටු රැස්වීම මෙම ඉල්ලීම සම්මත කිරීමට ද අනෙකුත් වතුවල මෙන්ම කර්මාන්තශාලා හා වැඩපොලවල එය සිංහල හා දෙමල භාෂාවෙන් මුද්‍රනය කර බෙදාහැරීම ආරම්භකිරීමට ද ඒකච්ඡන්දයෙන් තීන්දු කලේය.*

*ඉල්ලීමෙහි සඳහන්වන පරිදි, ක්‍රියාකාරී කමිටුව පිහිටුවීමේ තීරනයට එලඹුනේ සියලු වෘත්තීය සමිති පිලිබඳ කටුක අත්දැකීම්වල ප්‍රතිපලයක් වශයෙනි. රුපියල් 405 ක් නැතහොත් ඇමරිකානු ඩොලර් 3.50 ක දරිද්‍රතා මට්ටමේ දෛනික වැටුපක් සඳහා හාම්පුතුන් සමඟ ගිවිසුම් අත්සන් තැබූ සමිති මෙන්ම තමන් ඊට විරුද්ධ බව පවසන සමිති ද මීට ඇතුලත්ය. 2006 වසරේ ලංකා කම්කරු කොංග්‍රසය විසින් ඇතිකරගත් ගිවිසුමට විරුද්ධ බව කියා සිටි සමිති, පුලුල්ව පැතිර ගිය වැඩ වර්ජනය කඩාකප්පල් කිරීමට සහායදීම මඟින් ආන්ඩුවට හා හාම්පුතුන්ට ගිවිසුම කම්කරුවන් මත පැටවීමට අවස්ථාව සලසා දුන්නේය.*

*බැල්මොරල් වතු යායේ කම්කරුවන් විසින් ගත් දිරිමත් ආස්ථානය, දිවයින පුරා ද ජාත්‍යන්තරව ද විසිර සිටින කම්කරු පන්තියට පුලුල් වැදගත් කමක් දරා සිටියි. වෘත්තීය සමිති ඒ ඒ ආන්ඩු වලත්, මහා ව්‍යාපාර වලත් කාර්මික පොලිස්කාරයන් බවට පරිවර්තනය වීම ජාත්‍යන්තර ක්‍රියාවලියකි. භූගෝලීය නිෂ්පාදනයේ කොන්දේසි යටතේ ආන්ඩු, හාම්පුතුන් පමනක් නොව වෘත්තීය සමිති ද සෑම තැනකදීම කම්කරුවන්ට කියා සිටින්නේ ''ජාත්‍යන්තරව තරගකාරී'' වීමට නම් ඔවුන් කැප කිරීම් කල යුතු බවයි.*

*ශ්‍රී ලංකාවේදී වෘත්තීය සමිති, හාම්පුතුන්ගේ කොන්දේසි කම්කරුවන් මත පැටවීමට කටයුතු කර ඇතුවා පමනක් නොව, එල්ටීටීඊ සංවිධානයට එරෙහි ආන්ඩුවේ වර්ගවාදී යුද්ධයට ද කම්කරු පන්තිය යටත් කලහ. 2006 දී වතු කම්කරුවන් වැඩ වර්ජනය කල විට ජනාධිපති මහින්ද රාජපක්ෂ, ජාතික ආරක්ෂාවට වලකපන්නේ යයි ද "කොටි ත්‍රස්තවාදීන්ට" උදව් කරන්නේ යයි ද පවසමින්, ඔවුන් හෙලා දුටුවේය. මැයි මාසයේදී එල්ටීටීඊ පරාජය කිරීමෙන් පසුව ආන්ඩුව, රටේ ආර්ථික අර්බුදයේ බර වැඩකරන ජනතාව මත පැටවීම සඳහා ව්‍යාපාරිකයන් වෙනුවෙන් දැන් "ආර්ථික යුද්ධයක්'' දියත් කර තිබේ.*

*පසුගිය ඉරිදා බැල්මොරල් වතුයායේ ක්‍රියාකාරී කමිටු රැස්වීම පැවැත්වෙන අතරතුර කම්කරුවෝ, වෘත්තීය සමිතිවල පිටුබලය සහිතව ආන්ඩුව හා හාම්පුතුන් විසින් මර්දනය යොදාගැනීම පිලිබඳ සාධාරන උත්සුකයන් මතු කලහ. යුද්ධය පවතින අතරතුර ආන්ඩුව, රට තුල දැවැන්ත පොලිස් රාජ්‍ය යාන්ත්‍රනයක් ගොඩනගාගෙන තිබේ. මැයි මාසයේ සටන් පවතිද්දී පලා ආ 250,000 කට අධික දෙමල සිවිල් වැසියන් දින නියමයක් නොමැතිව රඳවා තැබීම මගින් ප්‍රජාතන්ත්‍රීය අයිතීන් කෙරෙහි ආන්ඩුව දක්වන සතුරු ආකල්පය මොනවට පෙන්නුම් කරයි. වැවිලි ක්ෂේත්‍රයේ ගිවිසුමට එරෙහිව හැටන් හා බගවන්තලාව ප්‍රදේශවල විරෝධතාවයේ යෙදුනු කම්කරුවන්ට දැනටමත් පොලිස් හා සමිති මැරයන් විසින් පහරදී තිබේ.*

*බැල්මොරල් වතුයායේ කම්කරුවන් හුදෙකලා කල නොහැක. වතුකරයේ ද රටපුරා ද සිටින අවශේෂ කම්කරුවන්ගෙන් අප ඉල්ලා සිටින්නේ, මෙම කම්කරුවන්ට සහයෝගය පල කරන යෝජනා සම්මත කරමින් හා පනිවිඩ යවමින්ද ඔවුන්ගේ මඟ පෙන්වීම අනුව යමින් තමන්ගේ අයිතීන් සඳහා සටන් වැදීමට ස්වාධීන ක්‍රියාකාරී කමිටු ගොඩනඟන ලෙස ය. මෙම අරගලයට සිය පූර්න සහයෝගය හා දේශපාලන ආධාර ලබාදෙන බවට සසප සහතික වෙයි.*

***

ආගරපතනේ බැල්මොරල් වතුයායෙහි කම්කරුවන් වන අපි, අපගේ අයිතීන් සඳහා සටන් වැදීමට අපගේම ක්‍රියාකාරී කමිටුවක් ගොඩනගාගෙන ඇත්තෙමු. වතුකරයේත් අනෙකුත් කර්මාන්ත අංශ වලත් කම්කරුවන් ද එසේ කල යුතු යයි අපි කියා සිටිමු.

නැවත නැවතත් අප පාවාදුන් වෘත්තීය සමිති කිසිවක් කෙරෙහි විශ්වාසයක් නොමැති නිසා අපි මේ පියවර ගත්තෙමු. සියලුම වතු සමිති තවත් වසර දෙකක් සඳහා දරිද්‍රතා මට්ටමේ වැටුපක් පිලිගන්නා ලෙසට අපට බලකිරීම සඳහා හාම්පුතුන් හා ආන්ඩුව සමඟ එක්ව කටයුතු කරති.

ලංකා කම්කරු කොංග්‍රසය (සීඩබ්ලිව්සී), ලංකා ජාතික වතු කම්කරු සංගමය (එල්ජේඊඩබ්ලිව්යූ) හා ඒකාබද්ධ වතු වෘත්තීය සමිති කමිටුව (ජේපීටීයූසී), ලබන දෙවසර සඳහා අපගේ උපරිම දෛනික වැටුප රුපියල් 405 කට සීමාකිරීමට, අපට පිටුපා හාම්පුතුන් සමඟ ගිවිසුමකට අත්සන් තැබූහ. ආරම්භක වැටුප් ඉල්ලීම වූ රුපියල් 750 හෝ එය රුපියල් 500 දක්වා කප්පාදු කිරීම හෝ ඊටත් වඩා බොහෝ අඩු මට්ටමක් පිලිගැනීම හෝ පිලිබඳව කිසිවෙකුත් අපගෙන් විමසීමක් කලේ නැත.

කඳුරට ජනතා පෙරමුන (යූපීඑෆ්) හා සමස්ත ලංකා වතු කම්කරු සංගමය (ඒසීපීඩබ්ලිව්යූ) වැනි අනෙකුත් සමිති පාවාදීමට විරුද්ධ බව කියා සිටිති. එහෙත් හුදෙක් ඔවුන් කරමින් සිටින්නේ 2006 දී ඔවුන් කල දේමය. එනම්, ආන්ඩුව හා වතු සමාගම් සමඟ ඔවුන්ගේම රහස් සාකච්ඡා පවත්වන අතරතුර කම්කරුවන් ස්වාධීනව ගන්නා කුමන හෝ පියවරක් කඩාකප්පල් කිරීමය.

මෙම සමිති කොලඹ දේශපාලන සංස්ථාපිතයේ හවුල්කරුවෝ වෙති. කඳුරට ජනතා පෙරමුනේ නායක චන්ද්‍රසේකරන් ආන්ඩුවේ ඇමතිවරයෙක් වන අතර, වත්මන් ආර්ථික අර්බුදයේ බර  කම්කරුවන් මත පැටවීමේ එහි ප්‍රතිපත්ති සමඟ පෙලගැසී සිටියි. ඒසීපීඩබ්ලිව්යූ, ජනතා විමුක්ති පෙරමුනට (ජවිපෙ) අනුබද්ධිත අතර, ජවිපෙ ජනාධිපති රාජපක්ෂ බලයට පත්කිරීමට උදව් කර, ඔහුගේ දෙමල විරෝධී යුද්ධයට හා යුද අයවැයට සහාය දී, ඔහුගේ දුෂ්ඨ හදිසි නීති බලතල වෙනුවෙන් සිය ඡන්දය පාවිච්චි කරයි.

මැදිහත්වී ගැටලුව නිරාකරනය කරන ලෙස චන්ද්‍රසේකරන් ජනාධිපති රාජපක්ෂට කන්නලව් කරයි. එහෙත් 2006 වසරේ රාජපක්ෂ මැදිහත්වූ අවස්ථාවේ දී, ඔහු සමිති වලට කියා සිටියේ සීඩබ්ලිව්සී ගිවිසුම පිලිගන්නා ලෙසයි. තමන්ට වෙන කිසිවක් කල නොහැකි බව පවසමින් ඔවුහු හිස නමා එය පිලිගත්හ. ඔවුන් යලි වතාවක් එයම කරනු ඇත. රුපියල් 405 ගිවිසුමට සහාය දෙන ලෙස ආන්ඩුව දැනටමත් සමිති වෙත දන්වා තිබේ. බගවන්තලාවේදී ගිවිසුමට එරෙහිව කම්කරුවන් විරෝධය පෑ අවස්ථාවේ ආන්ඩුව, කම්කරුවන්ට කඳුලු ගෑස් ගසා ඔවුන්ගේ ඔලුගෙඩි වලට ඉහලින් වෙඩි තබන ලෙස පොලීසියට නියෝග කර එතැනට පිටත් කර යැවීය.

ආන්ඩුවේ හා හාම්පුතුන්ගේ කාර්මික පොලිස්කාරයන් ලෙස ක්‍රියාත්මක වන සමිති කෙරෙහි කම්කරුවන්ට කිසිදු විශ්වාසයක් තැබිය නොහැකිය. සෑම තැනකම සිටින කම්කරුවන්ට අප කියන්නේ ඔවුන් තමන්ගේම ස්වාධීන ශක්තිය මත විශ්වාසය තැබිය යුතු බවයි. අනෙකුත් වතුවල මෙන්ම, කර්මාන්තශාලාවල, පාසැල්වල, රෝහල්වල හා අනෙකුත් සේවා ස්ථානවල කම්කරුවන්ට, වෘත්තීය සමිති වලින් ස්වාධීනව තමන්ගේම ක්‍රියාකාරී කමිටු ගොඩනඟන ලෙස අප කියා සිටින්නේ එබැවින්ය. අප සියලු දෙනාම සිටින්නේ ජීවිතය ගැටගසාගත නොහැකි තත්ත්වයකය.

රැකියා, වැටුප් හා ජීවන තත්ත්වයන් මත එල්ල කෙරෙන ප්‍රහාරයන්ට එරෙහිව කිසිදු සටනක්, ප්‍රජාතන්ත්‍ර විරෝධී, පීඩාකාරී වෘත්තීය සමිති ව්‍යුහය තුල කල නොහැකිය. ඒ වෙනුවට අප යෝජනා කරන්නේ, අපගේ ඉල්ලීම් පෙල ගස්වා ගැනීමටත් ඒ සඳහා සටන් වදින ව්‍යාපාරයක් සැලසුම් කිරීමටත් ක්‍රියාකාරී කමිටු නියෝජිතයන්ගේ සමුලුවක් කැඳවීමටයි. මෙම ඉල්ලීම් අපගේ දෛනික වැටුප වැඩිකර ගැනීමේ තැනින් බොහෝ ඈතට යා යුතු බව ද අපි විශ්වාස කරන්නෙමු. දෛනික ශ්‍රම සූරාකෑමේ ක්‍රමය අවසානයකට ගෙන ඒමටත් අප සහ අපගේ පවුල් වලට ජීවත්වීමට සරිලන සහතික කල මාසික වැටුපක් සඳහාත් සටන් කිරීම අවශ්‍යය. නිවාස, පාසැල්, වෛද්‍ය පහසුකම් හා අනෙකුත් අවශ්‍යතා සඳහා විසඳුම් අවශ්‍යය.

හුදු වෘත්තීය ක්‍රියාමාර්ගයකට වඩා බොහෝදේ මෙම අරගලයට බැඳී පවතියි. අප නිරතව සිටින්නේ ආන්ඩුවට, හාම්පුතුන්ට හා සියල්ලටත් වඩා වෘත්තීය සමිති වලට එරෙහි දේශපාලන අරගලයක බව අපි තේරුම්ගෙන සිටින්නෙමු. වැටුප් අරගලය මුල්කොටගත් සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රකාශනය කියවා ඇති අපි ඒ සමඟ එකඟ වන්නෙමු. අනෙකුත් කම්කරුවන්ගෙන් ද අපි ඉල්ලා සිටින්නේ ඉන් මතුකර තිබෙන ප්‍රශ්න අධ්‍යයනය කොට ඒ සඳහා සිය බැරෑරුම් අවධානය යොමුකරන ලෙසයි. (කියවන්නඃ ''**ශ්‍රී ලංකාවේ වතු කම්කරුවන් සඳහා සමාජවාදී ක්‍රියාමාර්ගයක්**'')

ශ්‍රී ලංකාවේත් ලොව පුරාත් වැඩ කරන ජනතාවට

කියා සිටින්නේ ගෝලීය ආර්ථික බිඳවැටීමේ ප්‍රතිවිපාක වලට කරගැසිය යුත්තේ ඔවුන් බව යයි, එම ප්‍රකාශනයෙන් පෙන්වා දෙයි. එහෙත් අපි එයට වගකිව යුත්තන් නොවන අතර, අරාජක ලාභ පද්ධතිය මගින් නිර්මිත අර්බුදයක වගකීමට අප කරගැසිය යුතු නැත. ධනවත් අතලොස්සක්ගේ අවශ්‍යතා නොව, අපගේ ම අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා සමාජවාදී ආකාරයකට සමාජය ප්‍රතිනිර්මානය කිරීමේ අරගලයකට සෑම තැනකම කම්කරුවන් සමඟ අප ඒකාබද්ධ විය යුතුය.

අපගේ සිංහල සහෝදර සහෝදරියන් වෙත අපි විශේෂ ඉල්ලීමක් කරන්නෙමු. ආන්ඩු හා සියලුම සංස්ථාපිත පක්ෂ, අප අතර භේදයන් නිර්මානය කිරීමට දිගු කාලයක් තිස්සේම ඔවුන්ගේ වාර්ගික දේශපාලනය යොදාගෙන තිබේ. අප සියල්ලන් මුහුනදී සිටින්නේ එකම පන්ති ප්‍රශ්න වලටය. ආන්ඩුව හා මහා ව්‍යාපාර විසින් අපගේ ජීවන තත්ත්වයන් මත නොනැවතී පහර එල්ල කරයි. ඔවුන්ගේ යුද්ධය සඳහා කැපකල යුතුයයි අවධාරනය කිරීමෙන් අනතුරුව ආන්ඩුව දැන් ''ජාතිය ගොඩනැඟීමට'' කැපකරන ලෙස කියා සිටියි. එහෙත්, හුදෙක් මෙහි අර්ථය වන්නේ, ජාතික ධනයෙන් විශාල පංගුවකට හිමිකම් කියන ධනපති ප්‍රභූ පැලැන්තිය සඳහා තව තවත් කැපකිරීමයි.

රාජපක්ෂ ආන්ඩුව වැඩ කරන ජනතාවට එරෙහිව පොලිස්-රාජ්‍ය වැඩ පිලිවෙල යොදාගැනීමට කිසිසේත්ම නොපැකිලෙනු ඇතැයි අපි ඔබට කල්තියා අනතුරු අඟවන්නෙමු. යුද්ධය පැවති අවධියේ රාජපක්ෂ, වැඩ වර්ජනය කරන වරාය කම්කරුවන් ද, වතු කම්කරුවන් ද, ගුරුවරු ද, විශ්ව විද්‍යාල කාර්ය මන්ඩල මෙන්ම විරෝධතාවයේ යෙදුනු ශිෂ්‍යයන් හා ගොවීන් ද ජාතියට ද්‍රෝහි වන්නන් ලෙස හෙලා දුටුවේය. දැන් තම "ආර්ථික යුද්ධය" දියත්කර ඇති ආන්ඩුව, සිය ආර්ථික සැලසුම් වලටත්, ව්‍යාපාරික අවශ්‍යතාවන්ටත් අභියෝගයක් වන ඕනෑම අයෙකුට එරෙහිව එවැනිම රුදුරු පියවර ගනු ඇත.

අපට තනිව ම සටන් කල නොහැකිය. අප සියලු කම්කරුවන්ට යෝජනා කරන්නේ තමන්ගේ ම ක්‍රියාකාරී කමිටු ගොඩනැඟීමටත්, අපගේ ඉල්ලීම හා සසප ප්‍රකාශනය අනෙකුත් අය අතර හැකිතාක් පුලුල් ලෙස බෙදාහැරීමටත්, අප හා සසපය අමතන ලෙසත්, ඊලඟ පියවර තීන්දුකර ගැනීමට සමුලුවක් සූදානම් කිරීම සඳහා නියෝජිතයන් තෝරා පත්කරගන්නා ලෙසත්ය.

© www.wsws.org